| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/01/පොදු-covid19/2020 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | දිනය<br>திகதி<br>Date 2021.08.28 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස්/මුදල්/ඉංජිනේරු සේවා/සැලසුම්),
ලේකම් (ප්‍රධාන/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර/ක්‍රීඩා) අමාත්‍යාංශය,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්.
දකුණු පළාත.

**<u>රජයේ ප්‍රතිපත්ති හා තීරණ ආයතන සංග්‍රහයට පටහැනිව විවේචනය කිරීම.</u>**

මේ වන විට රටේ පවතින තත්වය කළමනාකරණය කිරීම සඳහා රජය විසින් ගනු ලබන විවිධ ප්‍රතිපත්තිමය තීන්දු හා තීරණයන් ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව සමාජ මාධ්‍ය ජාල හා විවිධ සූක්ෂම ක්‍රම උපයෝගී කර ගනිමින් පළාත් සභාව යටතේ ඇති ආයතනවල නිලධාරීන් විසින් විවේචනය කරන අවස්ථා නිරීක්ෂණය වී ඇත.

02. ජනමාධ්‍ය සහ මහජනතාවට නිල ප්‍රවෘත්ති සැපයීම සහ ප්‍රකාශ නිකුත් කිරීම සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII පරිච්ඡේදයේ 6 හා 7 වගන්තීන් කෙරෙහිද ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා පරිපාලන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විධිවිධාන පවතින, ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ XXXI වන පරිච්ඡේදයේ 3 වගන්තිය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2019 කෙරෙහිද ඔබගේ අවධානය යොමු කරවමි.

03. එකී විධිවිධාන අනුව කටයුතු කිරීම සියළු නිලධාරීන්ගේ වගකීම හා යුතුකම වන බැවින්, එකී විධිවිධාන පිළිපැදීම සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතන නිලධාරීන් දැනුවත් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු අතර, එකී වගන්ති උල්ලංඝනය වන අයුරින් හෝ ඊට පරිබාහිරව ක්‍රියාකිරීම සම්බන්ධයෙන් යම් ගැටළුකාරී තත්වයක් වාර්තා වුවහොත් ඒ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට එරෙහිව සෘජුවම විනයානුකූල පියවර ගැනීමට සිදුවන බව කාරුණිකව දන්වා සිටිමි.

04. මෙම නිවේදනය නිකුත් කරනු ලබන්නේ ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් අනුවය.

**ආර්.සී.ද සොයිසා**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත


| | | | |
|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary: 091 2232343 | කාර්යාලය<br>காரியாலயம்<br>Office: 091 4119010, 091 2226118 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax: 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail: chiefsec1@sltnet.lk |
| වෙබ් අඩවිය<br>இ தளம்<br>Web site: www.cs.sp.gov.lk | | | |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"